.සැ. යු.- 2010.07.09 වැනි දින පළ වූ අංක 1,662 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,663 - 2010 ජූලි මස 16 වැනි සිකුරාදා - 2010.07.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I කොටස : (III) වැනි ඡේදය - වෙළෙඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... ... ... | 232 |
| වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... ... | — |
| පේටන්ට් බලපත්‍ර පිළිබඳ නිවේදන ... ... ... | — |
| කාර්මික සැලසුම් පිළිබඳ නිවේදන ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජූලි මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජූලි මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

231- B 79884— 3,050 (2010/07)
C1-

# වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම්

## වෙළෙඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළෙඳ ලකුණුවලට අදාළ සියලුම ලියුම් කියුම් කොළඹ 10, ඩී. ආර්. විජයවර්ධන මාවතේ, අංක 400, ''සමාගම් මැදුරේ'' 3 වැනි මහළේ, පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුය.

## පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ සෑම ක්‍රියාකාරී දිනකම පෙරවරු 9.00 සිට පස්වරු 3.30 දක්වා ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා ඉල්ලුම්පත්‍ර ක්‍රියාකාරී දිනවල පස්වරු 2.00 දක්වා පමණක් භාරගනු ලැබේ.

## වර්ණවලට සීමාවූ වෙළෙඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමඟ ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

## ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති ලකුණක්, 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහ පනතේ 112 වැනි වගන්තිය යටතේ, තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිතා කරනු ලබන බවට සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකය ද දක්වනු ලැබේ.

## විරෝධතා දැක්වීම

පහත සඳහන් වෙළෙඳ සේවා හෝ සාමූහික ලකුණු ලියාපදිංචි කිරීම ගැන විරෝධතාවය දැක්වීමට හේතු ඇති යම් කෙනෙකු මෙම ගැසට් නිවේදනයේ දින සිට තුන් මාසයක් ඇතුළත ඇම් 2 දරන ආකෘති පත්‍රය (අනු පිටපතකින් ද යුක්තව) මගින් විරෝධතා දැක්වීම ඉදිරිපත් කළ යුතුය. එබඳු විරෝධතා දැක්වීමක් සඳහා ගාස්තුව රු. 750 වන අතර එම ගාස්තුව මුදලින්, චෙක්පතකින්, මුදල් ඇණවුමකින්, තැපැල් ඇණවුමකින් හෝ බැංකු අණකරයකින් ගෙවිය යුතුය.

---

(1) ලකුණේ අංකය: 119341 ; (2) ලැබුණු දිනය: 2004 මැයි මස 21 වැනි දින; (3) ප්‍රමුඛත්වය සඳහා හිමිකම් ප්‍රකාශ කරන්නේ නම් දිනය :— ; (4) ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය : මෙරිල් ජේ. ප්‍රනාන්දු ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් පනත යටතේ සංස්ථාගත කර ඇති සීමිත වගකීම් සහිත සමාගමකි, 111, මීගමු පාර, පෑලියගොඩ - නිෂ්පාදනය කරන්නෝ සහ අපනයනය කරන්නෝ ; (5) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය : මෙරිල් ජේ. ප්‍රනාන්දු ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, 111, මීගමු පාර, පෑලියගොඩ ; (6) පන්තිය: 25 ; (7) භාණ්ඩ හෝ සේවා : රෙදිපිළි, පාවහන්, හිස් ආවරණ ; (8) ලකුණේ සටහන :

මෙම ලකුණ ලියාපදිංචි කිරීමෙන් 'නිව්', 'වර්ල්ඩ්', 'ඔෆ්', 'ටී' යන වචන සඳහා තනි අයිතිය නොලැබේ. මෙම ලකුණ අංක 119282 ලකුණ ලියාපදිංචි කළහොත් හෝ කරනවිට ඒ හා සංයෝජිත කෙරේ.

ඩී. එම්. කරුණාරත්න,
බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්.

2005 ජූලි මස 14 වැනි දින,
ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය,
කොළඹ.

07-412 — 2010.07.16 දින අංක 1,663 දරන ගැසට් පත්‍රය.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.